Verité Research
Strategic Analysis for Asia

# එන්නත්කරණ සමානාත්මතාවය කෙරෙහි වාර්ගික විවිධත්වයේ බලපෑම

2021 නොවැම්බර්

## පර්යේෂණය පිළිබඳ සමස්ත අදහස සහ සන්දර්භය

- ශ්‍රී ලංකාවේ වෙසෙන දමිළ, මුස්ලිම් සහ සිංහල වාර්ගික සමාජයන් අතර, කොවිඩ්-19 එන්නත් සම්බන්ධයෙන් ඇති විශ්-වාසය, එන්නත් ලබා ගැනීම සහ ඊට ප්‍රවේශය හා සබැඳිව අන්තර්ජාලයේ හුවමාරු වන අදහස් හඳුනා ගෙන ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම උදෙසා සමාජ මාධ්‍ය අධීක්ෂණයක් සිදු කිරීම, මයිනොරිටි රයිට්ස් ගෲප් ඉන්ටර්නැෂනල් (Minority Rights Group International) වෙරිටේ රිසර්ච් ආයතනය (Verité Research) වෙත පවරන ලදී. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහණයෙන් 74.9% ක් සිංහල ජනවර්ගයෙන් සමන්විත වන අතර සිංහල භාෂාව ඔවුන්ගේ මවු භාෂාව වේ. දමිළ සහ මුස්ලිම් සුළු ජනවර්ග එක්ව ගත් කළ සමස්ත ජනගහණයෙන් 24.8% ක් නියෝජනය කරයි.[1] දමිළ භාෂාව, දමිළ ජනතාවගේත් බහුතරයක් මුස්ලිම් ජනතාවගේත් මවු භාෂාව ලෙස සැලකේ. මීට අමතරව, සම්බන්ධීකරණ භාෂාවක් (link language) ලෙස ශ්‍රී ලංකාවේ භාවිතා වන ඉංග්‍රීසි භාෂාව, ජනගහණයෙන් 22%ක් විසින් භාවිතා කරනු ලැබේ.[2]

- මෙම අධ්‍යයනයට ඇතුළත් කර ඇති සොයාගැනීම්, 2021 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ ෆේස්බුක් සහ ට්විටර් ඔස්සේ සිදුකරන ලද සමාජ මාධ්‍ය අධීක්ෂණයන්ට අදාළ වේ. මෙහිදී සමාජ මාධ්‍ය වෙත අවධානය යොමු කරන පර්යන්තයක් වන Brandwatch සහ සමාජ මාධ්‍ය අධීක්ෂණ පර්යන්තයක් වන CrowdTangle යොදාගනිමින්, භාවිතය ඔස්සේ පිරික්සා බලන ලද මූලයෙදුම් මාලාවක් (keywords) පදනම් කොට ගෙන, දත්ත ලබාගැනීම සිදුකර ඇත.

- මෙම වාර්තාව සඳහා, ෆේස්බුක් කමෙන්ටු සහ ට්වීට් (ට්වීට් සඳහා වන ට්වීට් ප්‍රතිචාරද  ඇතුළත්ව) 1,276 ක සමස්ත නියැදියක (n=1,276), සංවාදයන් හරහා ප්‍රකාශ කෙරෙන අදහස් විශ්ලේෂණයට ලක් කෙරී ඇත. (1) කොවිඩ්-19 එන්නත් පිළිබඳ විශ්වාසය, (2) එන්නත් සම්බන්ධ සැකසංකාවන්, (3) එන්නත් සඳහා ප්‍රවේශය, සහ (4) එන්නත් ලබාදීම් හා එන්නත් පිළිබඳ තොරතුරු බෙදාහැරීම් සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශය හා වෙනත් රාජ්‍ය ආයතන පිළිබඳව  ඇති අවිශ්වසය යන සංවාද පසුබිම් ඊට ඇතුළත් විණි.

- අධ්‍යයනය සඳහා ෆේස්බුක් කමෙන්ටු හා ට්වීට් තෝරා ගැනීම නිර්ණායක දෙකක් මත පදනම්ව සිදු කෙරිණි: 1) ඉහත සඳහන් කරන ලද අදහස්වලින් සමන්විත වන බවට සාක්ෂි පැවතීම සහ 2) කමෙන්ටුව/ට්වීට් ප්‍රකාශය හරහා එම කමෙන්ටුව/ට්වීට් ප්‍රකාශය පළ කරන ලද තැනැත්තාගේ වාර්ගිකත්වය හඳුනා ගැනීමට හැකියාවක් තිබීම. එබැවින්, මෙම වාර්තාවෙහි ඇතුළත් සොයගැනීම් දමිළ, මුස්ලිම් සහ සිංහල සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර බෙදී ගොස් පැවති ෆේස්බුක් කමෙන්ටු සහ ට්වීට්වලට සීමා වී පවතින අතර සමස්තයක් ලෙස ඉන් එම ප්‍රජාවන් නියෝජනය වීමක් සිදු නොකෙරේ.

- එලෙසම, නියැදිය තෝරා ගැනීමේදී භාවිතා කරනු ලැබූ ක්‍රමවේදය මගින් නැඹුරු නොවන සමාජ මාධ්‍ය පරිශීලක නියෝජනයක් සහතික නොකෙරේ. එන්නත කෙරෙහි වැඩි විශ්වාසයක් තැබූවන් අතර කමෙන්ටු පළ කිරීමට ඇති නැඹුරුව අඩු විය හැකි අතර ඒ හේතුවෙන් නියැදිය තුළ ඔවුන්ගේ නියෝජනය අඩු මට්ටමක පැවතිය හැක.

- කෙසේ නමුත්, විශ්ලේෂණයට අදාළව උපකල්පනය කළ යුතු වන්නේ සමාජ මාධ්‍ය තුළ ක්‍රියාශීලී වීම සහ කමෙන්ටු පළ කිරීම කෙරෙහි වාර්ගිකත්වයේ බලපෑමක් නොමැති බවයි. මෙම තත්ත්-වයන් යටතේදී, නියැදිය තුළින් ප්‍රකාශ වන අදහස්වල පවතින වාර්ගිකත්වය පදනම් කරගත් වෙනස්කම්, සමස්ත ජනගහණයේ එක් එක් ජනවර්ගයක් තුළ පවතින අදහස්  හඳුනා ගැනීම උදෙසා ඇගැයීමට ලක් කළ හැක.

- ශ්‍රී ලංකාව සිය කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන 2021 ජනවාරි 29 වැනි දින ආරම්භ කරන ලදි.[3] මෙම වාර්තාව සම්පාදනය කරන මොහොත වන විට, නිල සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 16 ට වැඩි ජනගහණයෙන් 84% ක් එන්නත් මාත්‍රා දෙකම ලබාගෙන ඇත.[4] එසේම, රටේ ඉදිරිපෙළ වෘත්තිකයින්ට සහ වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයි-න්ට කොවිඩ්-19 බූස්ටර් එන්නත (තෙවැනි මාත්‍රාව) ලබාදීමද ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශ විසින් මෑතක සිට අරඹා ඇත.[5]

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ‘ජන හා නිවාස සංගණනය 2012 - අවසන් වාර්තාව’, ප්‍රවේශය http://www.statistics.gov.lk/Population/StaticalInformation/CPH2011/CensusPopulationHousing2012-FinalReport [අවසන් වරට ප්‍රවේශය 2021 දෙසැම්බර් 8].

2 අශානි අබේසේකර, ‘Building a More English-Literate Sri Lanka: The Need to Combat Inequities’ [ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වඩා ඉහළ සාක්ෂරතාවයක් සහිත ශ්‍රී ලංකාවක් බිහි කිරීම: අසමානතා පිටුදැකීමේ අවශ්‍යතාවය], 2018 අප්‍රේල් 23, ප්‍රවේශය https://www.ips.lk/talkingeconomics/2018/04/23/building-a-more-english-literate-sri-lanka-the-need-to-combat-inequities/ [අවසන් වරට ප්‍රවේශය 2021 දෙසැම්බර් 8]

3 රාජ්‍ය බුද්ධි සේවය, ‘Covid-19 Vaccination Sri Lankan Approach’ [කොවිඩ්-19 එන්නත්කරණය සඳහා වූ ශ්‍රී ලාංකේය පිවිසුම], ජනාධිපති ලෙකම් කාර්යාලය, ප්‍රවේශය http://www.presidentsoffice.gov.lk/.Documents/Concept%20Paper-COVID%2019_Vaccination-Sri_Lankan_Approach.pdf. [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29]

4 නිදහස් මෙහෙයුම කොවිඩ්-19 ට එරෙහි ක්‍රියාන්විතයේ නිල වෙබ් පිටුව, ‘එනනත්කරණ සංඛ්‍යාලේඛන’ ප්‍රවේශය https://covid19.gov.lk/vaccination-statistics.html [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29]

5 ‘Booster dose from November 01...’ [නොවැම්බර් 1 සිට බූස්ටර් මාත්‍රාව], ඔක්තෝබර් 2021, ජනාධිපති ලේකම් කාර්යාලය, ප්‍රවේශය https://www.presidentsoffice.gov.lk/index.php/2021/10/22/booster-dose-from-november-01/ [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29]

## අධ්‍යයනය තුළදී කැපී පෙනුණු සොයාගැනීම් පිළිබඳ සාරාංශය

1. **කොවිඩ්-19 එන්නත් විශ්වාස කළ හැකිද යන්න පිළිබඳ සැලකිලිමත් වීම්, තෝරාගත් දමිළ, මුස්ලිම් සහ සිංහල අන්තර්ජාල පරිශීලකයින්ගේ නියැදිය තුළ සිදු වූ අන්තර්ජාල සංවාදයන්හි ප්‍රමුඛස්ථානයක් ගෙන තිබිණි. එහෙත්, ඒ හා සම්බන්ධ ගැටළු කෙතරම් දුරකට ඉස්මතු වූයේද යන කරුණ මත ප්‍රජාවන් අතර වෙනසක් දක්නට තබිණි. ඒ අතරම, එන්නත් සඳහා ඇති ප්‍රවේශය සහ රාජ්‍ය අධිකාරීන් කෙරෙහි ඇති අවිශ්වාසය, සුළු අවධානයක් පමණක් ගෙන තිබිණි.**

   - විශ්ලේෂණයට බඳුන් වූ කමෙන්ටු සහ ට්වීට් සමස්ත නියැදියන් (n=1,276), 85% ක් අදාළ වූයේ කොවිඩ්-19 එන්නත් පිළිබඳ විශ්වාසය හා සම්බන්ධ සංවාදයන්ට වූ අතර, 36% ක් එන්නත් සඳහා ඇති ප්‍රවේශයටත්, 29% ක් සෞඛ්‍ය හා රාජ්‍ය අධිකාරීන් පිළිබඳ අවිශ්වාසයටත් අදාළ විණි.[6]

2. **සිංහල සමාජ මාධ්‍ය පරිශීලකයින්ට සාපේක්ෂව ගත් විට, මුස්ලිම් සහ දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයින් තුළ, කොවිඩ්-19 එන්නත් හා සම්බන්ධ විශ්වාසය අඩු මට්ටමක සිට කිසිම විශ්වාසයක් නොපැවතීම දක්වා දිවීමේ නැඹුරුතාවක් දක්නට ලැබිණි.**

3. **කොවිඩ්-19 එන්නත් වල ආරක්ෂාව පිළිබඳ වූ සැකසංකාවන්, කොවිඩ්-19 එන්නත් පිළිබඳ අඩු විශ්වාසයක් තිබූ පුද්ගලයින් අතර සංවාදයේ මූලික තැන් ගෙන තිබිණි.**

4. **නියැදිය අතුරින්, කොවිඩ්-19 එන්නත්වල ආරක්ෂාව පිළිබඳ සැකසංකා වැඩිවශයෙන්ම මතු කරනු ලැබුවේ මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් විසිනි.**

5. **සිංහල, දමිළ හා මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්, සයිනොෆාම් එන්නතට වඩා ෆයිසර්-බයෝඑන්ටෙක් සහ/හෝ මොඩර්නා එන්නත් සම්බන්ධයෙන් වඩා වැඩි විශ්වාසයක් පෙන්වා තිබිණි.**

## වාර්ගිකත්වය යනු, ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 එන්නත් පිළිබඳ ඇති විශ්වාසයට සංඛ්‍යාත්මක ලෙසින් වැදගත් බලපෑමක් වන සාධකයකි

- කොවිඩ්-19 එන්නත් සම්බන්ධ විශ්වාසය පිළිබඳ තක්සේරු කිරීමට යොදාගත් ෆෙස්බුක් කමෙන්ටු සහ ට්වීට් නියැදියෙන් (n=1,081), ඉහළ විශ්වාසයක් දක්වා තිබුණේ 28% ක් පමණි. එය, වාර්ගික කණ්ඩායම් තුනම තුළ කොවිඩ්-19 එන්නත් පිළිබඳ අඩු විශ්වා-සයක් සහ කිසිදු විශ්වාසයක් නොපෙන්වූ[7] කමෙන්ටු සහ ට්වීට් ප්‍රමාණයෙන්(48%) අඩකට වඩා මඳක් වැඩි සංඛ්‍යාවකි.[8]
- කොවිඩ්-19 එන්නත් පිළිබඳ විශ්වාසයට, වාර්ගිකත්වය සංඛ්‍යා-ත්මකව බලපෑමක් සිදුකරන විශේෂ සාධකයක් වන්නේද යන කරුණ නිශ්චය කරගැනීම උදෙසා, පියර්සන්ගේ චි-චතුරස්‍ර (Chi-squared) පරීක්ෂණය භාවිතා කරන ලදි. මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල (p අගය = 1.212e-08) මගින් පෙන්නුම් කරන්නේ, එන්නත පිළිබඳව ඇති විශ්වාසයේ මට්ටම, සමාජ මාධ්‍ය පරිශීලකයාගේ වාර්ගිකත්වය මත රඳා පවතින බවට ප්‍රබල සාධක ඇති බවයි.
- සිංහල පරිශීලකයන්ට (24%) සාපේක්ෂව මුස්ලිම් (49%) මෙන්ම දමිළ (36%) පරිශීලකයන්ද වඩාත් අඩු විශ්වාසයක් දැක්වීමේ නැඹුරුතාවක් පෙන්වා තිබිණි. මේ අනුව, සුළුතර වාර්ගික ප්‍රජාවන්ට අයත් වූ සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර අඩු විශ්වාස මට්ටමක් පැවතීම වැඩි වශයෙන් දක්නට ලැබුණු අතර, බහුතර සිංහල ප්‍රජාවට අයත් සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර බහුලව (42%) කොවිඩ්-19 එන්නත පිළිබඳ ඉහළ විශ්වාසයක් දක්නට ලැබිණි (නිදර්ශක අංක 1 බලන්න).
- මේ අතර, කොවිඩ්-19 එන්නත් කෙරෙහි කිසිදු විශ්වාසයක් නොපෙන්වූ සමාජ මාධ්‍ය පරිශීලකයින්ගේ සංඛ්‍යාව, වාර්ගික කණ්ඩායම් තුනම අතර යම් තාක් දුරකට සමානව විසිරී තිබිණි.

**නිදර්ශකය 1:** එන්නත කෙරෙහි දැක්වූ විශ්වාසයේ මට්ටම වෙන් වෙන් වශයෙන් දැක්වීම (වාර්ගිකත්වය මත පදනම්ව)




6 සටහන: එක් කමෙන්ටුවක් හෝ ට්වීට් පණිවිඩියක් අධ්‍යයනය තුළින් අවධානය යොමු කරන ලද අංශ එකකට වඩා අදාළව ඇගැයීමට ලක් කළ හැක. එනම්, එන්නත් කෙරෙහි ඇති විශ්වාසය, එන්නත් වෙත ඇති ප්‍රවේශය හෝ රාජ්‍ය අධිකාරීන් යන අංශ තුනයි. මේ හේතුවෙන්, එක් එක් අංශය සඳහා ගණනය කරන ලද මුළු කමෙන්ටු/ට්වීට් පණිවිඩ සංඛ්‍යාව, ඒ සඳහා වූ මුළු නියැදියට වඩා වැඩි සංඛ්‍යාවක් විය හැක.


7 මෙහි අඩු විශ්වාස මට්ටම නිර්වචනය වී ඇත්තේ, කොවිඩ්-19 එන්නත් කෙරෙහි (කුමන එන්නත වුවත්) යමෙකු යම් කිසි අවිශ්වාසයක් හෝ සැකසංකාවන් දැක්වීමක් ලෙසිනි. කිසිදු විශ්වාසයක් නොපවතින මට්ටම නිර්වචනය වන්නේ, කොවිඩ්-19 එන්නත් කෙරෙහි පූර්ණ අවිශ්වාසයක් ඇති සහ එම එන්නත් ලබාගැනීම ප්‍රතික්ෂේප කරනා අය සම්බන්ධයෙනි.

8 සටහන: එන්නත් කෙරෙහි පවතින විශ්වාසය වෙනුවෙන් ඇගැයීමට ලක් කිරීමට නොහැකි වූ කොමෙන්ටු හා ට්වීට් පණිවිඩ ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොගන්නා ලදි.

## අඩු විශ්වාස මට්ටම අඩු වීමේ ප්‍රවණතාවකුත්, කිසිදු විශ්වාසයක් නොපෙන්වීමේ මට්ටම දිගටම පැවතීමේ ප්‍රවණතාවකුත් පෙන්නුම් කරයි


- 2021 ජනවාරි මාසයේ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන ආරම්භ කිරීමේ සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ, වාර්ගික කණ්ඩායම් තුනටම අයත් සමාජ මාධ්‍ය පරිශීලකයන් අතර ‘අඩු විශ්වාස’ මට්ටම පහළ යෑමේ ප්‍රවණතාවයක් දක්නට ලැබිණි (නිදර්ශක අංක 2 බලන්න). මෙම සොයාගැනීම, 2021 සැප්තැම්බර් මසින් අවසන් වන කාලසීමාව තුළ සිදු වූ ශ්‍රී ලංකාවේ එන්නත්කරණයේ ශීඝ්‍ර වර්ධනය හා සමපාත වේ.[9]
- මේ අතර, කොවිඩ්-19 එන්නත් කෙරෙහි කිසිදු විශ්වාසයක් පෙන්නුම් නොකළ සමාජ මාධ්‍ය පරිශීලකයින්ගේ සංඛ්‍යාව විශාල වශයෙන් වෙනස් නොවී පැවතුණු අතර, 2021 මාර්තු, අප්‍රේල් සහ සැප්තැම්බර් යන මාසවලදී පමණක් සැලකිය යුතු තියුණු වර්ධනයන් කිහිපයක් පෙන්වීය (නිදර්ශක අංක 3 බලන්න). ශ්‍රී ලංකාවේ එන්නත්කරණ වැඩසටහන 2021 ජනවාරි මාසයේ ආරම්භ කෙරුණද, පොදු මහජනතාව එන්නත් කිරීම සඳහා යොමු වීම බොහෝ සෙයින් 2021 මාර්තු මාසයේ සිට සිදු විණ. එම නිසා, නිදර්ශක අංක 3 හි මාර්තු-අප්‍රේල් මාසවල පෙන්නුම් කරන වර්ධනයන් මෙම සංසිද්ධිය වටා ඇති වූ සාකච්ඡාවන් පිළිඹිබු කිරීමට ඉඩ ඇත.[10] 2021 සැප්තම්බර් මාසයේදී ශ්‍රී ලංකාව විසින් 20-30 වයස් කාණ්ඩය සඳහා එනන්ත ලබා දීම ආරම්භ කරන ලද අතර නිදර්ශක අංක 3 හි එම මාසයේදී දක්නට ලැබෙන වර්ධනය හරහා එන්නත ලබා ගැනීම කෙරෙහි මෙම වයස් කාණ්ඩය අතර නිරීක්ෂණය වූ වඩා වැඩි අකැමැත්ත පිළිඹිබු විය හැක.[11]

**නිදර්ශකය 2:** 2021 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ කොවිඩ්-19 එන්නත කෙරෙහි පැවති අඩු විශ්වාසය කාලය සමඟ වෙනස් වූ අයුරු




සටහන: සමස්ත ජනගහණයෙන්, 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය අතරතුර එක් කොවිඩ්-19 මාත්‍රාවක් හෝ ලබා ගත් ප්‍රතිශතයද නිදර්ශකය 2 න් දක්වේ (මූලාශ්‍රය: සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ නිල වෙබ් අඩවිය; ප්‍රවේශය https://www.epid.gov.lk/)

**නිදර්ශකය 3:** 2021 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ කොවිඩ්-19 එන්නත කෙරෙහි කිසිදු විශ්වාසයක් නොපැවතීමට අදළ විශ්වාස මට්ටම කාලය සමඟ වෙනස් වූ අයුරු




සටහන: මෙම අධ්‍යයනය, ජනවාරි 1 සිට ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ සිදු කරන ලදි. එම කාලසීමාවෙන් පසු එන්නත්කරණ ශීඝ්‍රතාව ඉහළ ගොස් ඇති අතර, ඉහත ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරෙන්නේ එම මොහොතේ සමාජ මාධ්‍ය පරිශීලකයන් අතර තිබූ විශ්වාසයේ මට්ටම වේ. නියැදි ප්‍රමාණය සාපේක්ෂව කුඩා වීම නිසා, 2021 ඔක්තෝබර් මාසයේ දත්ත මීට ඇතුළත් කර නොමැත.

## කොවිඩ්-19 එන්නත් පිළිබඳ අඩු විශ්වාසයක් පැවති පුද්ගලයින්ගේ සංවාදයන් අතර, එන්නතේ ආරක්ෂාව සම්බන්ධ සැකසංකාවන් ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදි

- වාර්ගික කණ්ඩායම් තුනම සැලකූ විට, කොවිඩ්-19 එන්නත්වල ආරක්ෂාව පිළිබඳ සැකසංකාවන් පළ කළ සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර (64%), ‘අඩු විශ්වාස‘ මට්ටම ඉහළම ප්‍රමාණයකින් දක්නට ලැබිණි (නිදර්ශක අංක 4 බලන්න). එන්නත් ශීඝ්‍රයෙන් නිෂ්පාදනය කරනු ලැබීම, අතුරු ආබාධ පිළිබඳ බිය මෙන්ම එන්නත් සංයුතිය පිළිබඳ බිය, වාර්ගික කණ්ඩායම් අතර කොවිඩ්-19 එන්නත්වල ආරක්ෂාකාරී බව පිළිබඳ සැකසංකාවන්ට තුඩු දී තිබිණි.
- ‘කොවිඩ්-19 එන්නත්වල ආරක්ෂාව පිළිබඳ අවිශ්වාසය’ මත පදනම් සැකසංකාවන්, කොවිඩ්-19 එන්නත් පිළිබඳ ‘කිසිදු

9 වෙරිටේ රිසර්ච්හි FactCheck.lk හි නිල ට්විටර් පිටුව, ‘Covid-19 Vaccination Scoreboard as of 27 September 2021’ [වෙරිටේ රිසර්ච් හි 2021 සැප්තැම්බර් 27 දිනැති කොවිඩ්-19 එන්නත්කරණ ලකුණු පුවරුව]. ප්‍රවේශය https://twitter.com/factchecklka/status/1442492284428189701?s=20 [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29]

10 ඩිලාන් උදයංග, ‘Getting Vaccinated against COVID-19 in Sri Lanka (All You Need to Know’ [ශ්‍රී ලංකාවේදී කොවිඩ්-19 සඳහා එන්නත ලබා ගැනීම: ඔබ දත යුතු දේ], 2021 අප්‍රේල් 8, ප්‍රවේශය: https://www.durdans.com/getting-vaccinated-against-covid-19-in-sri-lanka-allyou-need-to-know/ [අවසන් වරට ප්‍රවේශය 2021 දෙසැම්බර් 8].

11 චංක ජයසිංහ, ‘Sri Lanka health authorities pled with young people to get vaccinated’ [එන්නත ලබා ගන්නා ලෙසට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශ තරුණ ප්‍රජාවගෙන් අයැද සිටී], 2021 සැප්තැම්බර් 22, ප්‍රවේශය: https://economy-next.com/sri-lanka-health-authorities-plead-with-youngpeo-ple-to-get-vaccinated-86359/ [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29].

විශ්වාසයක් නොපෙන්වූ' අදහස් පළ කළ පුද්ගලයින් අතර ප්‍රමුඛව දක්නට ලැබිණි (44%). කෙසේ නමුත්, එන්නත් පිළිබඳ 'අඩු විශ්වාසයක්' දැරූ අය මෙන් නොව එන්නත් පිළිබඳ 'කිසිදු විශ්වාසයක් නොපෙන්වූ' පුද්ගලයින් කෙරෙහි, කුමන්ත්‍රණ හා බැඳි බිය (conspiracy related fears) (20%), සාම්ප්‍රදායික ඖෂධ තෝරාගැනීම (ආයුර්වේද සහ අත්බෙහෙත්) (12%) මෙන්ම, ස්වභාවික ප්‍රතිශක්තිය කෙරෙහි ඇති විශ්වාසය (3%) යන සාධක වැඩි වශයෙන් බලපා ඇති බව දකින්නට ලැබිණි.

**අධ්‍යයනයට අදාළ ගුණාත්මක සොයාගැනීම් (කමෙන්ට්/ට්වීට්වලින් ගත් උපුටා ගැනීම්):**

"இந்த வக்சீனின் மூலப் பொருள் என்ன? இதன் பின்னனி என்ன?இதை போடுவதால் ஏற்படும் விளைவுகள் என்ன? இப்படி அறிவுள்ள சமூகமாக கேள்வி கேட்டு விளங்க வேண்டும். முட்டாள்களைப் போல எல்லாவற்றுக்கும் தலையாட்டிக் கொண்டு செல்ல கூடாது

[පරිවර්තනය: මෙම එන්නත සඳහා යොදා ගෙන ඇති මූලද්‍රව්‍ය මොනවාද? මෙහි පසුබිම කුමක්ද? මෙය ලබා ගැනීමේ ඵලවිපාක මොනවාද? බුද්ධිමත් සමාජයක් ලෙසින් අප විසින් [මෙය] ප්‍රශ්න කර අවබෝධයක් ලබා ගත යුතුයි. අප මෝඩයින් ලෙස සෑම දෙයකටම හිස වැනීම නොකළ යුතුයි.]

- මුස්ලිම් ෆේස්බුක් පරිශීලකයෙක්

"එන්නත තුල ද ඇත්තේ වෛරස් එකක් මම නම් විදින්නේ නෑ


- සිංහල ෆේස්බුක් පරිශීලකයෙක්

"இப்பதானா ஆய்வு செய்றிங்கோ... முடிவு பண்ணிட்டிங்க சாகடிக்க

[පරිවර්තනය: ඔබ දැන්ද පර්යේෂණ කරන්නේ?... ඔබ අපිව මරන්න/මැරෙන්න ඉඩ අරින්න තීරණය කරලා තිබෙන්නේ]

- දමිළ ෆේස්බුක් පරිශීලකයෙක්

**නිදර්ශකය 4:** 'අඩු විශ්වාසය' හෝ 'කිසිදු විශ්වාසයක් නොපැවති' ලෙස ඇගැයීමට ලක්වූ ප්‍රකාශ තුළින් කොවිඩ්-19 එන්නත්වලට අදාළව දක්වන ලද සැකසංකා





සටහන: 'අඩු විශ්වාසය' සහිත කාණ්ඩය යටතේ 'වෙනත්' යනුවෙන් දක්වා ඇති සැකසංකා යටතට 'ගර්භණී මව්වරුන්ට අනාරක්ෂිත වීම' හා 'සාම්ප්‍රදායික වෙදකමට වඩා කැමැත්තක් දැක්වීම' යන සැකසංකාද ඇතුළත් කර ඇත. කමෙන්ටුවලින් 5% ත් වඩා අඩු ප්‍රතිශතයක් හරහා පමණක් මෙම සැකසංකා ඉදිරිපත් වී තිබීම ඊට හේතුවයි. එමෙන්ම, 'කිසිදු විශ්වාසයක් නොමැති' කාණ්ඩය යටතේ කමෙන්ටුවලින්ද 5% ත් වඩා අඩු ප්‍රතිශතයක් හරහා පමණක් 'සරුබව මත බලපෑම්/ලිංගික ගැටළු', 'ආගමික විශ්වාස' සහ 'ස්වාභාවික ප්‍රතිශක්තිය කෙරෙහි ඇති විශ්වාසය' යන සැකසංකා ඉදිරිපත්ව තිබිණි. එබැවින්, 'කිසිදු විශ්වාසයක් නොමැති' කාණ්ඩය සඳහා එම සැකසංකා 'වෙනත්' යන සැකසංකා ගණයට ඇතුළත් කර ඇත.

## කොවිඩ්-19 එන්නත්වල ආරක්ෂාව හා සම්බන්ධ ගැටළුකාරී තත්ත්වයට අදාළ අදහස්, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් විසින් වැඩි වශයෙන් දක්වන ලදී

- කොවිඩ්-19 එන්නත් කෙරෙහි සැකසංකාවන් පළ කරනු ලැබූ කමෙන්ටු සහ ට්වීට්, සාපේක්ෂව සමානව වාර්ගික කණ්ඩායම් තුනම තුළ පැතිර තිබිණි. කෙසේ නමුත්, සිංහල (34%) සහ දමිළ (36%) සමාජ මාධ්‍ය පරිශීලකයින්ට සාපේක්ෂව, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්, කොවිඩ්-19 එන්නත්වල ආරක්ෂාව පිළිබඳ වැඩි වශයෙන්ම සැකසංකාවන් (48%) දක්වා තිබිණි (නිදර්ශක අංක 5 බලන්න).
- සැලකිය යුතු පරිද්දෙන්, සිංහල සමාජ මාධ්‍ය පරිශීලකයින් විසින්, කොවිඩ්-19 සඳහා වන එන්නත් ලබාගනු වෙනුවට සාම්ප්‍රදායික ඖෂධ ක්‍රම (ආයුර්වේද සහ අත්බෙහෙත්) භාවිතා කිරීම සම්බන්ධයෙන් වැඩි වශයෙන්ම අනුබල දී තිබිණි (නිදර්ශක අංක 5 බලන්න). දමිළ සංස්කෘතිය තුළ සාම්ප්‍රදායික ජන වෛද්‍ය ප්‍රතිකර්ම භාවිතය බහුල වශයෙන් දක්නට ලැබුණත්, දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයන් අතර ඉහත කියූ ආකාරයේ සංවාදයන් දක්නට නොතිබිණ.

**නිදර්ශකය 5:** කොවිඩ්-19 එන්නත් කෙරෙහි පවතින සැකසංකා (වාර්ගිකත්වය අනුව)




සටහන: 'ගර්භණී මව්වරුන්ට අනාරක්ෂිත වීම', 'සරුබව මත බලපෑම්/ලිංගික ගැටළු', 'ආගමික විශ්වාස' සහ 'ස්වාභාවික ප්‍රතිශක්තිය කෙරෙහි ඇති විශ්වාසය' යන සැකසංකා මෙහිදී 'වෙනත්' යන්නට ඇතුළත් කර තිබේ. කමෙන්ටුවලින් 2% ක් හෝ ඊට අඩු ප්‍රතිශතයක් පමණක් මෙම සැකසංකා ඉදිරිපත් කර තිබීම ඊට හේතුවයි. මීට අමතරව, සයිනොෆාම් එන්නතට වඩා ෆයිසර් එන්නත සඳහා ඇති කැමැත්තද මෙම සැකසංකා යටතේ ඇති එක් කාණ්ඩයක් ලෙසට විශ්ලේෂණයේදී සැලකිල්ලට ගන්නා ලදි. ඒ අනුව, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්ගේ කමෙන්ටුවලින් 18%ක්, දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයින්ගේ කමෙන්ටුවලින් 20%ක් සහ සිංහල සමාජ මාධ්‍ය පරිශීලකයින්ගේ කමෙන්ටුවලින් 29%ක් තුළින් මෙම අදහස ඉදිරිපත් වී තිබිණි. එනමුත්, එම සංඛ්‍යාවන් 'වරණීය විශ්වාසය' යන කොටස යටතේදී විශ්ලේෂණය කර ඇති බැවින් නිදර්ශකය 5 ට ඇතුළත් කර නොමැත.

**අධ්‍යයනයට අදාළ ගුණාත්මක සොයාගැනීම් (කමෙන්ට්/ට්වීට්වලින් ගත් උපුටා ගැනීම්):**

"Lab rats! 🐀 Anyone know about the side effects of the vaccine after few years later¿? 🔎 💉
[පරිවර්තනය: පරීක්ෂණාගාර මීයෝ! කවුරුවත් දන්නවද අවුරුදු කීපයකට පස්සේ මේ එන්නත් වල අතුරු ප්‍රතිඵල ගැන?]

- මුස්ලිම් ෆේස්බුක් පරිශීලකයෙක්

"මම නම් විද්දෙ නෑ වදින්නෙත් නෑ මට කොරොනා හැදිලා අදට දවස් 12 යි කිසිම අමාරුවක් නෑ සිංහල බෙහෙත් බිව්වා හෙම්බිරිස්සාවක් හැදුණු තරමට වත් අමාරුවක් නෑ තවම ගඳ සුවඳ දැනෙන්නේ නෑ එච්චරයි.

– සිංහල ෆේස්බුක් පරිශීලකයෙක්

"இந்த தடுப்பூசி நல்லதோ கெட்டதோ இனி தெரியவரும். எலிக்கு பாசோதித்த மாதிரி போட்டாச்சு
[පරිවර්තනය: මේ එන්නත් හොඳද නරකද කියන එක අනාගතයේදී දැනගන්න ලැබෙයි. අපිව එනනත් කරේ මීයන්ව පර්යේෂණවලට පාවිච්චි කරන විදියට]


– දමිළ ෆේස්බුක් පරිශීලකයෙක්

## සිංහල, දමිළ හා මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්, සයිනොෆාම් එන්නතට වඩා ෆයිසර්-බයෝඑන්ටෙක් සහ/හෝ මොඩර්නා එන්නත් කෙරෙහි වැඩි කැමැත්තක්/වැඩි විශ්වාසයක් පෙන්වයි.

- 'වරණීය විශ්වාසය'[12] පෙන්වන ආකාරයේ කමෙන්ටු සහ ට්වීට්, වාර්ගික කණ්ඩායම් තුනම අතර සාපේක්ෂව සමාන බෙදී යෑමක් පෙන්වූවද (නිදර්ශක අංක 6 බලන්න), තමන් ලබාගැනීමට කැමති කුමන කොවිඩ්-19 එන්නත් සන්නාමයද යන්න පිළිබඳව, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්ට සාපේක්ෂව සිංහල සහ දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයින් වඩා ප්‍රබල ස්ථාවරයක් දැරූ බව දක්නට ලැබිණි.

12 කොවිඩ්-19 සඳහා වන එන්නත් ගන්නට/ලබාගැනීමට යම් කිසි කැමැත්තක් පෙන්වන අතරම, තමන් ගන්නට/ලබාගන්නට කැමැත්තේ කුමන එන්නතද කියා මනාපයක් දැක්වීම වරණීය විශ්වාසය ලෙසින් නිර්වචනය කෙරී ඇත.

**නිදර්ශකය 6:** ෆයිසර් සහ/හෝ මොඩර්නා එන්නත් ආශ්‍රිතව පවතින වරණීය කැමැත්ත/විශ්වාසය (Selective confidence/ preference) වාර්ගිකත්වය අනුව බෙදා දැක්වීම




- සමාජ මාධ්‍ය දත්ත ඔස්සේ පෙන්නුම් කෙරෙන්නේ, ශ්‍රී ලංකාවේ පුළුල් වශයෙන් ලබාදුන් චීනයේ නිෂ්පාදිත සයිනොෆාම් එන්නතට වඩා ඇමෙරිකානු සමාගම් විසින් නිෂ්පාදිත ෆයිසර් සහ/හෝ මොඩර්නා එන්නත් ලබාගැනීමට කැමැත්ත පළ කළ පරිශීලකයින් අතර (වාර්ගික කණ්ඩායම කුමක් වුවත්) 'වරණීය විශ්වාසය' ඉහළම මට්ටමක තිබූ බවයි (73%). ඒ අනුව, වරණීය කැමැත්ත/විශ්වාසය පළ කළ කමෙන්ටු අතරින්, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් 74% ද, සිංහල සමාජ මාධ්‍ය පරිශීලකයින් 72% ද, දමිළ සමාජ මාධ්‍ය පරිශීලකියන් 55% ද සයිනොෆාම් එන්නතට වඩා ෆයිසර් සහ/හෝ මොඩර්නා එන්නත් ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළහ. (සටහන: 'වරණීය කැමැත්ත/විශ්වාසය' පළ කළ ඉතිරි කමෙන්ටු 27% හරහා සයිනොෆාම් එන්නතට වඩා ෆයිසර් සහ/හෝ මොඩර්නා එන්නත් ලබා ගැනීමට ඇති කැමැත්ත විශේෂ වශයෙන් සඳහන් නොවිණ. ඒ හැර වෙනත් හේතු එම කමෙන්ටු හරහා ඉදිරිපත් කරන ලදි.)
- සමස්තයක් ලෙසින් ගත් විට, සයිනොෆාම් එන්නත පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සහ/හෝ එහි ආරක්ෂාව හා සඵලකාරිත්වය කෙරෙහි ඇති අවිශ්වාසය පැන නැග තිබෙන්නේ ප්‍රධාන කරුණු ත්‍රිත්වයකිනි. 1) චීනයේ නිෂ්පාදිත එන්නතක ගුණාත්මකභාවය පිළිබඳව ඇති බිය, 2) ගෝලීය සංචාරය සැලකීමේදී සයිනොෆාම් එන්නත සඳහා සාපේක්ෂව අඩු රටවල් සංඛ්‍යාවකින් අනුමැතිය ලැබී තිබීම සහ 3) ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන චීන ආර්ථික හා දේශපාලනික බලපෑම එම කරුණු තුනයි (අදාළ ගුණාත්මක සොයා ගැනීම් පිළිබඳ කොටස බලන්න).

**අධ්‍යයනයට අදාළ ගුණාත්මක සොයාගැනීම් (කමෙන්ට්/ට්වීට්වලින් ගත් උපුටා ගැනීම්):**

"#Pfizer is only for VIP? Is (it) possible to vaccine the public? Would prefer to have #Pfizer will it be able to vaccine?

[පරිවර්තනය: ෆයිසර් VIP අයට විතරද? මහජනතාවට එන්නත් ලබාදෙන්න හැකියාවක් තිබෙනවාද? ෆයිසර් ලබාගන්න කැමතියි. එය ලබාගන්න හැකි වෙයිද?]

– මුස්ලිම් ෆේස්බුක් පරිශීලකයෙක්

"බාල බඩු වල හිලක් ඇතේ කිව්වේ කට කහනවට නෙමෙයි. චීනේට ඔනේ වැඩක් නැති බෙහෙත් අපිට දීලා මිනිස්සු මරලා රට අස්තාවර කරලා ණය වලින්ම අපේ රට අල්ල ගන්න


– සිංහල ෆේස්බුක් පරිශීලකයෙක්

"சீனாக்காரன் எங்கடா உங்களுக்கு மருந்து தந்தான் அது வெறும் மழைத்தண்ணிதான்

[පරිවර්තනය: චීන ජාතිකයින් කවද්ද ඔබට ඖෂධ ලබා දුන්නේ? (එන්නත් ලෙසින්) ඒ ලබාදී ඇත්තේ වැසි ජලයයි.]

– දමිළ ෆේස්බුක් පරිශීලකයෙක්

**නිදර්ශකය 7:** 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා 'අඩු විශ්වාස මට්ටම' පැතිර ඇති ආකාරය




සටහන: මෙම අධ්‍යයනය, 2021 ජනවාරි 1 සිට ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ සිදු කරන ලදි. එම කාලසීමාවෙන් පසු එන්නත්කරණ ශීඝ්‍රතාව ඉහළ ගොස් ඇති අතර, ඉහත ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරෙන්නේ එම මොහොතේ සමාජ මාධ්‍ය පරිශීලකයන් අතර තිබූ විශ්වාසයේ ප්‍රමාණයයි. තවදුරටත්, නියැදි ප්‍රමාණය සාපේක්ෂව කුඩා වීම නිසා, 2021 ඔක්තෝබර් මාසයේ දත්ත මීට ඇතුළත් කර නොමැත.

- සමාලෝචනයට බඳුන් වූ කාලය තුළ, සමාජ මාධ්‍ය පරිශීලක-යින් අතර වරණීය විශ්වාස මට්ටම ඉහළ යෑමේ ප්‍රවණතාවයක්, නිදර්ශක අංක 7 ඔස්සේ පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකාවේ වයස 20 ට වැඩි අය සඳහා කොවිඩ්-19 එන්නත් ලබාදීමට සෞඛ්‍ය අධිකාරීන් විසින් ගත් තීරණය හා මෙම සොයාගැනීම සමපාත වීම විශේෂත්වයකි.[13] ශ්‍රී ලංකාවේ තරුණ පරපුර (වාර්ගික කණ්ඩායම කුමක් වුවත්), ඉහළම සඵලතාවය ඇත්තේ ෆයිසර්-බයෝඑන්ටෙක් එන්නතටය යන විශ්වාසය උඩ, ෆයිසර් එන්නත සඳහා මනාපයක් පෙන්වීම කෙරෙහි, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අධිකාරීන් කණස්සල්ල පළ කොට තිබිණි.[14]

## ස්තූතිය

මෙම වාර්තාව වෙරිටේ මාධ්‍ය කණ්ඩායම විසින් මයිනොරිටි ගෘප් ඉන්ටර්නැෂනල් සඳහා සම්පාදනය කොට ඇත. මහෝෂධී පීරිස් මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂිකාව මෙන්ම මෙම වාර්තාවේ කතුවරිය ද වෙයි. රවීකා ප්‍රනාන්දු මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ කළමනාකාරිණිය විණි. දත්ත ප්‍රමාණාත්මකව ඇගයුම් කිරීම සඳහා අශ්වින් පෙරේරා විසින් සහාය ලබා දෙන ලදී. මූලික පර්යේෂණ සහය රවීකා ප්‍රනාන්දු, දේශිත කදිරගොන්න, අමන්ති පුස්සෙපිටිය සහ ගව්රි සැමුවෙල් වෙතිනි. සමස්ත පර්යේෂණ අධීක්ෂණය දීපාංජලී අබේවර්ධන සහ නිශාන් ද මැල් විසින් ලබාදෙන ලදී. ඉන්ෆොග්‍රැෆික් නිර්මාණය ඒඩ්‍රියන් මාර්කස් ගෙනි. දිනුක් සේනාපතිරත්න විසින් සැකසුම් සහය ලබා දෙන ලදී. මෙම අධ්‍යයනය සම්බන්ධ අදහස් සහ කෙටුම්පත් සමාලෝචනයටත්, අදහස් පළ කිරීමටත් සිය කාලය වෙන් කිරීම පිළිබඳව, ඉහත නම් සඳහන් අයවලුන් වෙත කතුවරයා බෙහෙවින්ම කෘතඥතාපූර්ව වෙයි.

minority
rights
group
international

*මෙම ලේඛනයේ අන්තර්ගතය පිළිබඳ වගකීම හුදෙක්ම වෙරිටේ රිසර්ච් ආයතනය වෙත පැවරී තිබෙන අතර කිසිදු අවස්ථාවක එය මයිනොරිටි රයිට්ස් ගෘප් ඉන්ටර්නැෂනල් සංවිධානයේ මතය පිළිඹිබු කරන්නක් ලෙසට සැලකිය නොයුතුය.*

13 Vaccination of children aged 18 and 19 from October 21' [වයස 18, 19 වයසැති ළමුන් සඳහා එන්නත්කරණය ඔක්තෝබර් 21 සිට], ජනාධිපති ලේකම් කාර්යාලය, 2021 සැප්තැම්බර්, ප්‍රවේශය https://www.presidentsoffice.gov.lk/index.php/2021/10/08/vaccination-of-children-aged-18-and-19-from-october-21 [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29]

14 චංක ජයසිංහ, 'SSri Lanka health authorities pled with young people to get vaccinated, ඍදශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන් එන්නත ලබා ගන්නා ලෙස තරුණ තරුණියන්ගෙන් අයැද සිටී], 2021 සැප්තැම්බර් 22, ප්‍රවේශය https://economy-next.com/sri-lanka-health-authorities-plead-with-young-people-to-get-vaccinated-86359/ [අවසන් වරට ප්‍රවේශය 2021 නොවැම්බර් 29]